# කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව
# වෛද්‍ය පීඨය
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## මෘත දේහ පරිත්‍යාගශීලීන් සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ වෛද්‍ය පීඨයේ කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරනු ලබන උපදෙස් පත්‍රිකාව

වෛද්‍ය අධ්‍යාපනයේ නියැලෙන්නන්හට තම අධ්‍යාපන කටයුතු නිසsලෙස සම්පූර්ණ කරගැනීම සඳහා මිනිස් සිරුරේ ව්‍යුහය අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍යවේ.

මෙය සපුරා ගැනීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව මගින් මෘත දේහ පරිත්‍යාග ලෙස භාරගැනීමට කටයුතු යොදා ඇත.

පහත සඳහන් හේතුන් එකක් හෝ ඇත්නම් එම මෘතදේහ පරිත්‍යාග ලෙස භාරගැනීමට නොහැකි බව කරුණාවෙන් සළකන්න.

- වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන්ගේ මෘතදේහ
- පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකළ මෘතදේහ
- ඇස් දන්දීම හැර අවයව ඉවත් කල හෝ පරිත්‍යාග කල අයගේ මෘතදේහ
- හදිසි අනතුරු, පිලිකා, ශල්‍යකර්ම ආදියට භාජනයවූ සිරුරු
- මෙනින්ජි ප්‍රදාහය, ක්ෂයරෝග, සෙංගමාලය, එච්.අයි.වී, ඒඩ්ස් වැනි ආසාදනයට හෝ අංශභාගයට ලක්වූ සිරුරු
- එම්බාම් කිරීමකින් තොරව පැය18 ක් කල් ඉකුත්වූ සිරුරු
- විවෘත තුවාල, ඇඳවණ, දිරාගිය පටක විකලාංග හේතූන් සහිත සිරුරු

මෙම මෘතදේහ **ගබඩාකර තබාගැනීමේ සීමාව සම්පූර්ණ වන අවස්ථාවන්ට මුහුණදීමට ඉතා කලාතුරකින් අපට සිදුවේ.** යම්හෙයකින් එවැනි අවස්ථාවක් යෙදුනහොත් එම අවස්ථාවේදී පමණක් ඉතා කනගාටුවෙන් වුවත් එම සිරුරු භාරගැනීමට නොහැකිවන බව කරුණාවෙන් සළකන්න.

දෙපාර්තමේන්තුවට රැගෙන එන මෘතදේහ වලට දෙපාර්තමේන්තුව තුළදි නැවත ෆෝමලීන් එන්නත් කරනු ලබයි. එසේ කිරිමේදි එන්නත් කිරිමට අපහසුතා ඇතිවුවහොත් එය කල් තබා ගැනීමට නොහැකි නිසා ඒවා නැවත භාරකරුවන් වෙත ලබා දීමට කලාතුරකින් හෝ සිදු විය හැකි බව කරුණාවෙන් සළකන්න.

## මුල්‍යමය වගකීම්

මෘත දේහ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් වෛද්‍ය පීඨයට මුදල් යෙදවීමට හැකියාවක් නොමති බැවින් තමන්ගේ වියදමින් මෘත දේහ රැගෙන ආයුතු බව දන්වා සිටිමු. අවශ්‍ය <u>අධ්‍යයන කටයුතු අවසාන කිරීමෙන් පසු</u> මෘතදේහ පිළිබඳ අවසන් කටයුතු අපගේ මැදිහත් වීමෙන් සිදුකරනු ලැබේ.

**ඉතා වැදගත්( මෘත දේහ භාර ගැනිමේදි එය පරිත්‍යාගයක් බැවින් ඒ සඳහා කිසිදු මුදලක් අය කරනු නොලැබේ.**

## මරණය සිදුවූ වහාම

පවුලේ ළඟම ඥාතියෙකු/භාරකරුවකු/රෝහල් කර්ය මණ්ඩල සමාජිකයකු විසින් ඒ බව සතියේ දිනවල (සති අන්තයේ සහ රජයේ නිවාඩු දින හැර) පෙ.ව.8.30 සිට පස්වරු 3.00 දක්වා කාලය තුළ කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුවේ දුරකථන අංක 081-2396262 අමතා මෘත දේහය භාරදීමට කටයුතු පිලියෙල කරගත යුතුය.

## මෘත දේහය භාරදීමට පැමිණෙන විට

- උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද මරණය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපතක්
- මෘත දේහය භාරදෙන තැනැත්තාගේ හැඳුනුම්පත (මෘත දේහය භාරදෙන අවස්ථාවේ ඉදිරිපත් කල යුතුය) එහි ඡායා පිටපතක් ද අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.

- **කිසිවෙකුටත් මුදල් පරිත්‍යාගක් ලෙස හෝ දීමෙන් වළකින්න**
- **ඒ සඳහා යොදවා ඇති කාර්යභාර තාක්ෂණික නිලධාරියා සමග පමණක් සියලූ ගණුදෙණු සිදු කරන්න**
- **කාර්යභාර තාක්ෂණික නිලධාරියාගේ නම ඔබට මෘත දේහ භාර දීම සඳහා පැමිණීමට ප්‍රථම දුරකථන මගින් දැනුම් දෙනු ලබන අතර, ඔහුගේ නම හා දුරකථන අංකය භාරදෙන ස්ථානයේ දැන්වීම් පුවරුවේ සඳහන් කර ඇත.**

## එම්බාම් කරන්නේ නම්

**මෘත දේහය මල් ශාලාවකට භාර දෙන විට පහත සඳහන් උපදෙස් මල්ශාලාකරුවන් හට ලබා දිය යුතුය**

එම්බාම් කිරීම සිදුකල යුත්තේ කලවයේ පිහිටි ඌර්ව ධමනියට ෆෝමලීන් එන්නත් කිරීමෙන් පමණි. (මෙහි ඇති රූප සටහනින් දක්වා ඇති පරිදි) සිරුරේ කිසිම අවයවයක් ඉවත් කිරීම හෝ සිදුරු කිරීමක්වත් නොකිරීමට තරයේ උපදෙස් දිය යුතුය. එසේ නොවන්නේ නම් මෘත දේහය භාරනොගැනීමටද බොහෝ දුරට ඉඩ ඇත.

මෘත දේහය පරිත්‍යාග කිරීමට කැමති මහනුවර සහ අවට පදිංචිකරුවන් නම් මෘත දේහය අප දෙපාර්තමේන්තුවට රැගෙනවිත් අප විසින් කරන විශේෂිත එම්බාම් කිරීම කර එම මෘත දේහය රැගෙන ගොස් නැවත අප වෙත භාරදිය හැක. එසේම අප සතුව ඇති මිනී පෙට්ටියක් වුවද ලබා ගත හැක.

සතියේ දිනක මෘත දේහය දෙපාර්තමේන්තුවට භාර දෙන්නේනම් පස්වරු 3.00 ට පෙර භාරදිය යුතුය. මෘත දේහය **සති අන්තයක** හෝ **ප්‍රසිද්ධ නිවාඩු දිනවලදී** භාර දෙන්නේ නම් **පහත සඳහන් දුරකථන අංකයකට** අමතා කටයුතු සූදානම් කරගත හැකිය.

| **නම** | **දුරකථන අංකය** |
|---|---|
| ඒ.ජී.ජී විජේරත්න මහතා | 071 - 4460912 |
| ඩබ්.එම්.ඩබ්.සී විජේනායක මහතා | 071 - 7623066 |

මෘත දේහය භාරදීමෙන් පසු පෙට්ටිය ආපසු රැගෙන ගිය හැක. මෘත දේහය භාර දෙන විට දෙපාර්තමේන්තුව තුල ආගමික කටයුතු හෝ ඡායාරූප ගැනීම හෝ වීඩියෝ කිරීමට අවසර නොමැත.

## මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වීමට

මෘතදේහ පරිත්‍යාග කිරීමට කැමති අයගේ ප්‍රයෝජනය සඳහා විස්තර ලබාගැනීමට දෙපාර්තමේන්තු කාර්යාලයෙන් දුරකථන අංක 081-2396262 මගින් තොරතුරු දැනගත හැකි අතර ලියාපදිංචිය මගින් ඔබ හා අප අතර කිසිදු ආකාරයේ නීතිමය බැඳීමක් ඇති නොවන බව කරුණාවෙන් සලකන්න.

මෘතදේහ භාරගැනීම හෝ නොගැනීමේ සම්පූර්ණ අයිතියද දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය සතුබව කරුණාවෙන් සලකන්න. මෙය උපදෙස් පත්‍රයක් පමණි. ලියාපදිංචි වී නොතිබීම හෝ උපදෙස් පත්‍රයක් නොතිබීම මෘත දේහ භාරදීමට කිසිදු බාධාවක් නොවේ.

## මෘත දේහය භාරදීමෙන් පසු

මෘත දේහය දෙපාර්තමේන්තුවට පරිත්‍යාග කිරීමෙන් පසු එය දෙපාර්තමේන්තුව සතු බැවින් එහි සම්පූර්ණ වගකීම දෙපාර්තමේන්තුව සතුවේ. මෘත දේහය භාරදීමෙන් පසු නැවත ආපසු බැලීමටද අවස්ථාවක් දිය නොහැකි බව කරුණාවෙන් සලකන්න.

මෘත දේහය භාර දීමෙන් පසු **පරිත්‍යාග කරන්නාගේ නම වෛද්‍ය පීඨයේ වෙබ් අඩවිය තුළ සති කිහිපයකට ප්‍රදර්ශනයට කිරීමට අප තිරණය කර ඇත.** එය සිදු කරනු ලබන්නේ පරිත්‍යාග කරන්නා සහ ඔහුගේ ඥාතීන්ගේ අවසරය අනුවය.

වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔබ දක්වන සැළකිල්ල ඉතා අගයකොට සළකමි.

මීට
විශ්වාසී

අංශප්‍රධානී


ඌර්ව ධමනිය